www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීනයේ ඉඩම් ප්‍රතිසංස්කරන ධනවතුන් හා දුප්පතුන් අතර පරතරය ගැඹුරු කරනු ඇත

## China's land reform will deepen the gulf between rich and poor

**ජොන් චැන් විසිනි**
**2008 ඔක්තෝබර් 17**

චීන කොමියුනිස්ට් පක්ෂය (චීකොප) ඔක්තෝබර් 9-12 දිනවල පැවති සිය මධ්‍යම කාරක සභා සැසි වාරයේ දී, වෙලඳ පොල ප්‍රතිසංස්කරන පිලිවෙතේ වඩා දුර දිග යන නව අදියරක් දියත් කලේ ය. රැස්වීම ගොවීන්ට සිය සාමූහික හා රාජ්‍ය-සතු ඉඩම් හිමිකම් නිදහසේ අලෙවි කල හැකි රාමුවක් තහවුරු කලේ ය -- මෙය වනාහි මිලියන සංඛ්‍යාත සුලු ගොවීන් සිය ඉඩම්වලින් පලවා හැරීමට නොවැලැක්විය හැකි ලෙස ම තුඩු දෙනු ඇති විශාල පරිමාන කාර්මික කෘෂිකර්මය දෙසට වන පියවරකි.

රැස්වීම පැවැත්වුනේ ගෝලීය මන්දාවධමනයක් පිලිබඳ වැඩෙන උත්සුකතා මධ්‍යයේ ය. චීනයේ ප්‍රධාන අපනයන වෙලඳ පොලවල් සියල්ලේ ම -- උතුරු ඇමරිකාව, යුරෝපය සහ ජපානය -- වර්ධන වේගය තියුනු ලෙස කඩා වැටෙමින් තිබේ. කුඩා ගොවීන්ට ඉඩම් හිමිකම් විකිනීමට ඉඩ දීම මගින් චීකොප නායකයන් බලාපොරොත්තු වන්නේ, පාරිභෝගික වියදම් ඉහල දැමීම -- අඩු ගනනේ කෙටි කාලීනව -- සහ රටේ ඉහල ආර්ථික වර්ධන වේගය පවත්වා ගැනීම යි.

සංයුක්ත පියවර මොනවාද යන්න නිවේදනය කර නැති මුත්, බෙයිජිං පාලනය, ගොවීන්ට සිය ඉඩම් භාවිතය පිලිබඳ ගිවිසුම් අලෙවි කිරීමට අවසර දෙනු පිනිස, රාජ්‍ය මාධ්‍ය හා නිල විද්වතුන් හරහා, වේදිකාව සකසා තිබේ. 1980 ගනන්වල දී කෘෂිකර්මාන්තයේ සාමුහිකහරනය සිදු කරද්දී, චීකොප රාජ්‍ය-සතු ඉඩම් පුද්ගලීකරනය නොකල නමුත් කුඩා ඉඩම් කැබලි වසර 15ක් තිස්සේ භුක්ති විඳීමේ සහතිකයක් තනි ගොවි පවුල්වලට ලබා දුන්නේ ය. 1993 දී එම ගිවිසුම් වසර 30කට දීර්ඝ කරන ලදි.

අර්ථ ශාස්ත්‍රඥයන්ට හා පක්ෂ නිලධාරින්ට අනුව, නව ගිවිසුම් වසර 70ක් දක්වා දීර්ඝ කල හැකි අතර එමගින් සිය ඉඩම් සංගතවලට බඳු දීමට හෝ නය සඳහා ඇපකර ලෙස සිය ඉඩම් කට්ටි යොදා ගැනීමට ගොවීන්ට අවසර ලැබෙනු ඇත. ප්‍රායෝගිකව ගත් කල, මිලියන සංඛ්‍යාත ගොවීහු, විශේෂයෙන් ම නගරවල වැඩ කරන අය, සිය ඉඩම් දැනටමත් බඳු දී තිබේ. එහෙත් මෙම ගනුදෙනුවලට සාමාන්‍යයෙන් සම්බන්ධ වන්නේ සෙසු කුඩා ගොවින් මිස ව්‍යාපාරික ආයතන නොවේ.

ඉඩම් ප්‍රතිසංස්කරන, 2020 වන විට ග්‍රාමීය ආදායම දෙගුන කරනු ඇතැයි ද පොදු කාර්ය ව්‍යුහයේ, අධ්‍යාපනයේ හා සෞඛ්‍ය සේවයේ වැඩි දියුනුවක් ඒ සමග ම හට ගනු ඇතැයි ද මධ්‍යම කාරක සභා සැසි වාරයේ නිවේදනයක් සඳහන් කලේ ය. සාමාන්‍යයෙන් ප්‍රමානවත් වන්දි සැපයීමකින් තොරව ගොවීන්ගෙන් ඉඩම් අත්පත් කර ගෙන ඇති නිශ්චල දේපොල සංවර්ධකයන් සමග රාජ්‍ය නිලධාරින්ගේ හවුල්වීම මෙම ප්‍රතිසංස්කරන මගින් අඩු කෙරෙනු ඇති බව ද කියනු ලැබේ. ඉඩම් සම්බන්ධ නිල දූෂන ක්‍රියා ගොවීන්ගේ විරෝධතාවන්ට හා පොලීසිය සමග ඔවුන්ගේ ගැටුම්වලට ප්‍රධාන හේතුවක් වී තිබේ.

නව ප්‍රතිසංස්කරන ග්‍රාමීය දිලිඳුකම අවසන් කරනවා නොව, චීනයේ මිලියන 800ක් වන ගොවි ජනතාව මුහුන පාන සැබෑ ප්‍රතිවිපාකය වනු ඇත්තේ, ඉඩම් නැතිකම ශීඝ්‍රයෙන් ඉහල යාම සහ ධනවතුන් හා දුප්පතුන් අතර පරතරය නාටකාකාර ලෙස පුලුල් වීම යි. නව පිලිවෙතේ එල්ලය වන්නේ, සිය ඉඩම් කෘෂිකාර්මික ව්‍යවසායන්ට අතහැර දැමීමට ගොවීන්ට බල කිරීම සහ තව තවත් ලාභ ශ්‍රමය නිර්මානය කිරීම යි. ශීඝ්‍රයෙන් පිම්බෙන නාගරික ජනගහනය සඳහා ආහාර සැපයුම පවත්වා ගෙන යනු වස් විශාල පරිමාන කෘෂිකාර්මික නිෂ්පාදනයට හැරී ගැනීම, සුලු පරිමාන ගොවිතැනේ ඛාදනය වේගවත් කරනු ඇත.

රාජ්‍ය මාධ්‍ය, මෑතම පියවර මීට වසර 30කට ඉහත දී ඩෙන් ෂියාඕපිංගේ ආර්ථික පිලිවෙත් සමග සංසන්දනය කර තිබේ. සැප්තැම්බර් 30 දා ජනාධිපති හූ ජින්ටාඕ අන්හුයි පලාතේ ෂියාඕගෑං ගම්මානයට පුලුල් ප්‍රචාරයක් සහිතව සංචාරයක යෙදුනේ ය. 1978 දී සාමුහික ඉඩම් බෙදීමේ ඩෙන්ගේ පිලිවෙත පුරෝගාමී ලෙස ක්‍රියාවට දැම්මේ මෙම ගම්මානයේ ගොවීන් කන්ඩායමකි.

යලිත් වරක්, ෂියාඕගෑං ගම්මානය වෙලඳ පොල ප්‍රතිසංස්කරනවල පෙරමුනේ උද්ඝෝෂකයා ලෙස වර්නනා කෙරෙයි. නැන්ෆෑං ඩේලි ඔක්තෝබර් 10 කලාපයට අනුව, 1978 සාමුහිකහරනයට සම්බන්ධ වූ ගොවියකු වන යැන් ජින්චෑං, මීට වසර දෙකකට ඉහත දී, වාර්ෂික ලාභාංශයකට හිලව් වසයෙන්, සිය ඉඩම් ෂැංහයි-පාදක කෘෂි ව්‍යාපාරික ආයතනයකට බඳු දෙනු පිනිස, තවත් ගොවීන් දුසිමක් සමග, ගිවිසුමක් අත්සන්

කලේ ය. සමහරෙක් වැටුප් ලබන කම්කරුවන් වසයෙන් සමාගමට වැඩ කරති. තමන්ගේ ම ඉඩම වගා කිරීමෙන් ලබනවාට වඩා වැඩි මුදලක් වැටුප්, බදු කුලී හා ලාභාංශ ලෙස තමන් උපයන බව යැන් පුවත්පතට පැවසී ය.

ෂියාඕගැං ගම්මානයේ ඉඩම්වලින් සියයට 60ක් පමන බිම්මල්, මල්, මිදි වැවීමේ හා කුකුලන් ඇති කිරීමේ යෙදී සිටින වානිජ ආයතනවලට බඳු දෙනු ලැබ ඇත. පසුගිය වසරේ දී මෙම ගමේ ඒක පුද්ගල ආදායම, ග්‍රාමීය ඒක පුද්ගල ආදායමේ ජාතික සාමාන්‍යය වන යුආන් 4,100ට (එ.ජ. ඩොලර් 605) සංසන්දනාත්මකව, යුආන් 6,000ක් (එ.ජ. ඩොලර් 877) විය.

නව ප්‍රතිසංස්කරන ගෝලීය මූල්‍ය කව තුල පුලුල් ලෙස සාදරයෙන් පිලිගනු ලැබ ඇත. සුලු පරිමාන, යැපුම් ගොවිතැන "කෘෂිකාර්මික නිෂ්පාදන ඵලදායිතාවයේ වර්ධනයට හා ඉහල කාර්යක්ෂමතාවක් අත්පත් කරගැනීමට බාධා කරන" බව සිටිගෲප් අර්ථ ශාස්ත්‍රඥවරයකු වන හුආං යිපිං ප්‍රකාශ කලේ ය. එක්සත් ජනපදයේ හෙක්ටෙයාර් 173ට හා හංගේරියාවේ හා පෝලන්තයේ හෙක්ටෙයාර් 6ට සංසන්දනාත්මකව, නියම චීන ගොවිපලක් ප්‍රමානයෙන් හෙක්ටෙයාර් 0.6ක් වන බව *වෝල් ස්ට්‍රීට් ජර්නල්* ලිවී ය. එක්සත් ජනපදය, කැනඩාව හෝ ඕස්ට්‍රේලියාව වැනි දියුනු ධනපති රටවල යාන්ත්‍රිකකරනය කෙරුනු කෘෂිකර්මාන්තය කුඩා ශ්‍රම බලකායන් යොදා ගනිමින් ඉහල නිෂ්පාදනයක් දිගු කලක් තිස්සේ තහවුරු කොට නාගරික කර්මාන්ත සඳහා ශ්‍රමය නිදහස් කර ඇත.

නිසැකව ම, ඉඩම් සංකේන්ද්‍රනය විද්‍යාත්මක විධික්‍රම හා මහා පරිමාන නිෂ්පාදනය යොදා ගැනීමේ හැකියාව ලබා දෙයි. කෙසේ වෙතත්, කම්කරුවන්ට කොටස් ලබා දුන් ඒවා ද ඇතුලු, 1990 දී චීන රාජ්‍ය ගොවිපලවල් පුද්ගලීකරනය කිරීම මෙන් ම, මෑත ම ඉඩම් ප්‍රතිසංස්කරන ද නොවැලැක්විය හැකි ලෙස ම තුඩු දෙනු ඇත්තේ, යමක් කමක් ඇති ගොවීන්ගේ හා ග්‍රාමීය ව්‍යවසායකයන්ගේ අත්වල ඉඩම් අයිතිය සංකේන්ද්‍රනය වීමට සහ ගොවීන්ගේ බහුතරයක් අතර ඉඩම් නැතිකම නිර්මානය කිරීමට ය. චීන විශ්ලේෂකයෙක් ඔක්තෝබර් 8 දා *ෆිනෑන්ෂිල් ටයිම්ස්* පත්‍රයට මෙසේ පැවසී ය: "මෙම ප්‍රතිසංස්කරන නියම ධනපතියන්ට කෘෂිකාර්මික අංශයට ඇතුලුවීමට ඉඩ සලසනු ඇත. නමුත් අපට "පුද්ගලීකරනය" හෝ "ධනවාදය" යන වචන යොදා ගත නොහැකි ය. ඒ මක් නිසා ද කියතොත්, එය මෙම ප්‍රතිසංස්කරනයට විරුද්ධව සටන් කරන තද පිලිවෙත්කාරයන් අතට ආයුධ සම්පාදනය කිරීමක් පමනක් වනු ඇති බැවිනි."

"තද පිලිවෙත්කාරයන්" යන්න සැඳහුම් කරන්නේ ප්‍රතිසංස්කරන ග්‍රාමීය ප්‍රදේශවල අසහනකාරිත්වය උත්සන්න කිරීමට හේතු වනු ඇතැයි භීතියට පත්ව ඇති වීකොප නිලධරයේ කොටස්වලට ය. විසි වන සියවසේ සිදු වූ චීන විප්ලව තුන තුල දී ඉඩම් පිලිබඳ ගොවි ජනතාවගේ ඉල්ලීම්වල පැවති පුපුරන සුලු ස්වභාවය ගැන ඔවුහු හොඳින් දැන සිටියහ.

නව පිලිවෙත් ඉඩම් "මහා පරිමානයෙන් අස්වාමික කිරීම සඳහා එක වරක් පමනක් ලැබෙන අවස්ථාවක් සම්පාදනය කල හැකි" බවට *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රයේ ඔක්තෝබර් 12 දා කතුවැකියක් ප්‍රවේශම් සහගතව නිරීක්ෂනය කලේ ය. "එය වලකාලීමට සමත් වූවා වුනත් රාජ්‍ය මුදලින් නඩත්තු වන සෞඛ්‍ය සේවයේ හා අධ්‍යාපනයේ බාදනය හේතු කොට ගෙන "දුගී ගොවීන් (ඉඩම්) විකුනා දැමීමේ දැඩි ආර්ථික පීඩනයකට නතු විය හැකි ය." සමාජ අසහනකාරිත්වයන් පිපිරීමේ විභවය ගැන අනතුරු අඟවමින්, කතුවැකිය මෙසේ අදහස් දැක්වී ය: "වෙනසේ දිශාව පුද්ගලික අයිතිය දෙසට වූවා වුනත් කෘත්‍රිම ලෙස සමාජීය වෙනස්කම් සිදු කිරීම නිරතුරුව ම භයානක ය. බෙයිජිං පාලනය ඥානවන්තව ඉදිරියට යා යුතු ය. ප්‍රතිසංස්කරන ඉක්මන් වනවාට වඩා ඒවා සාධාරන වීම වැදගත් ය."

නව ගොවි ජන කැරැල්ලක් නාගරික කම්කරුවන් වෙතින් බලගතු සහයෝගයක් දිනා ගත හැකි ය. මිලියන 150කට අධික ග්‍රාමීය සංක්‍රමනිකයෝ දැන් මූලික නේවාසික අයිතීන් පවා තොරව ලාභ ශ්‍රමිකයන් ලෙස නගරවලට වැඩ කරති. චීන නගර, බොහෝ දියුනු වන රටවල දක්නට ලැබෙන ප්‍රසාරනය වන පැල්පත් මේ වන තෙක් වලකා ගෙන සිටී. ඒ මක් නිසා ද කියතොත් කුඩා ඉඩම් කැබලි නිරතුරුව ම සංක්‍රමනික කම්කරුවන්ට සිය රැකියා අහිමි වුව හොත් ඔවුන් සඳහා ආරක්ෂිත දැලක් සම්පාදනය කරනු බැවිනි. මෑත වසරවල දී, සමහර නිෂ්පාදන කලාප, වැඩි වැටුප් පිලිබඳ කම්කරු ඉල්ලීම් හේතු කොට ගෙන ශ්‍රම හිඟයකට මුහුන පා ඇත. සංක්‍රමනික කම්කරුවන්ට අඩු වැටුප් භාර ගැනීමට වඩා යලි සිය නිවෙස් බලා යා හැකි වී තිබේ. මෙය බෙයිජිං පාලනයට හා ගෝලීය සංගතවලට භාර ගත හැකි තත්වයක් නොවේ.

සැප්තැම්බර් 4 දා *ඉකොනමිස්ට්* මෙසේ ලිවී ය: "ලෝකයේ තනි වැදගත්ම මිල කුමක්ද? ජනප්‍රිය පිලිතුරු වනුයේ තෙල් මිල, ඇමරිකානු පොලී අනුපාතික හෝ ඩොලරය යන්න ය. එහෙත් චීන වැටුප් වඩා වැදගත් බවට තර්ක කල හැකි ය. මිලියන 800ක් පමන වන චීනයේ ශ්‍රම බලකාය මේ වන තෙක් ලෝකයේ විශාලතම ශ්‍රම බලකාය යි. එය ඇමරිකාවේ, යුරෝපා සංගමයේ හා ජපානයේ ශ්‍රම බලකායන්ගේ එකතුව මෙන් දෙගුනයකට සමාන තරම් ය. එනයින් ගත් කල, එය දුවන්නේ ලාභ ශ්‍රම හිඟයකට මුහුන පාමින් බවට කෙරෙන මෑත කියාපෑම් සත්‍ය නම්, එය හුදෙක් චීනයට පමනක් නොව සෙසු ලෝකයට ද දැවැන්ත ප්‍රතිවිපාක ගෙන එයි."

ශ්‍රම බලකාය ඉහල දමා ගැනීමට නම් කෘෂිකර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමට චීනයට සිදු වන බවට ඉකොනමිස්ට් තර්ක කරයි. "කුඩා ඉඩම් කැබලි සංකේන්ද්‍රනය හා යාන්ත්‍රිකකරනය නිෂ්පාදන ඵලදායිතාව ඉහල දමනු ඇත. එයින් අදහස් කෙරෙන්නේ වඩා අඩු ගොවීන් සංඛ්‍යාවක් අවශ්‍ය කෙරෙනු ඇති බවයි. එය පෙරලා කර්මාන්ත සඳහා වැඩි කම්කරු සංඛ්‍යාවක් නිදහස් කරනු ඇත. සංවර්ධිත රටවල ඉඩම් වගා කරන්නේ කම්කරුවන්ගෙන් සියයට 3ක් පමනි." යයි සගරාව සඳහන් කලේ ය. වෙනත් වචනවලින් කියතොත්, සෞභාග්‍යයේ නව කාල පරිච්ඡේදයක් භුක්ති විඳිනවා නොව, බොහෝ ගොවීන්ට සිය ඉඩම් අහිමි කරනු ලැබ සොච්චම් වැටුපකට සිය ශ්‍රම ශක්තිය විකිනීමට බල කෙරෙනු ඇත.

අව්‍යාජ සමාජවාදය සමග කිසිදු සම්බන්ධයක් නැති ගොවි ජන රැඩිකල්වාදයේ රූපාකාරයක් වන මාඕවාදයේ අවෘත අන්තය නව ඉඩම් පිලිවෙත මගින් අවධාරනය කෙරෙයි. මීට වසර 30කට ඉහත දී ඩෙන් සිය වෙලඳ පොල ප්‍රතිසංස්කරන දියත් කලේ, මාඕගේ ව්‍යසනකාරී "මහජන කොමියුන" පිලිබඳව ගොවීන් අතර පුලුල්ව පැතිර ගිය අසන්තෘප්තියට ආයාචනා කිරීම මගිනි. මෙම ප්‍රාථමික සාමූහිකකරනය කෙරුනු ගම්මානවලට මහා පරිමාන නිෂ්පාදනය සඳහා අවශ්‍ය කිසිදු තාක්ෂනික සම්පතක් නොතිබුනු අතර ප්‍රාථමික මට්ටමේ කාර්මිකකරනය සඳහා අවශ්‍ය මුදල් සම්පාදනය කරනු වස් ගොවීහු මිරිකීමට ලක් කෙරුනි. වෙලඳ පොල සහ පුද්ගලික දේපොල දෙසට ගොවීන් අතර පැවති ස්වයංසිද්ධික ප්‍රවනතා දිරිගැන්වීම කරනු පිනිස, ඩෙන් පුද්ගලික ගොවිතැන සහ සුලු පරිමාන ග්‍රාමීය ව්‍යවසායකත්වය සඳහා තල්ලුව දුන්නේ ය.

1980 ගනන් මුල ග්‍රාමීය ජීවන මට්ටම්වල ඇති වූ තාවකාලික වැඩි දියුනුවට බොහෝ සෙයින් හේතු වූයේ, පලතුරු වැවීමේ හෝ සිය පිලිකනුවල තොග රැස් කිරීමේ යෙදී සිටි ගොවීන් මත පනවා තිබූ විකාර සහගත සීමාවන් ඉවත් කිරීම යි. සහනය පැවතුනේ කෙටි කලක් පමනි. ඒ මක් නිසා ද කිය තොත්, ධනපති වෙලඳ පොල නොවැලැක්විය හැකි ලෙස ම ධනවතුන් හා දුප්පතුන් අතර ගැඹුරු සමාජ භේදයන්ට ද පුලුල්ව පැතිරුනු නිල දූෂනයට ද තුඩු දුන් බැවිනි. එම කොන්දේසි කෝටි සංඛ්‍යාත ගොවීන් කාලකන්නි පැවැත්මක් කරා ඉක්මනින් ම තල්ලු කලේ ය. චීනය තුල පමනක් නොව ලෝක පරිමානව වැටුප් පහලට තල්ලු කරන පීඩනයක් පවත්වා ගෙන යනු පිනිස දැවැන්ත අතිරේක ලාභ ශ්‍රම හමුදාවකට නොවැඩි දෙයක් බවට ඔවුහු පත් වූහ.

කාල් මාක්ස් ප්‍රාග්ධනයේ පලමු වෙලුමේ එතරම් මැනවින් ලියූ පරිදි, කෘෂිකර්මාන්තය තුල වැඩෙන ධනවාදී සබඳතා මගින් ගොවීන් ඉඩම්වලින් වෙන් කිරීම, කාර්මික ප්‍රාග්ධනය සඳහා ශ්‍රම බලකාය සහ වෙලඳ පොලක් සම්පාදනය කලේ ය. මාක්ස් ලියූ පරිදි, වෙලඳ පොල විසින් විනාශයට ලක් කරනු ලබන ග්‍රාමීය දුගී ජනයා "අඛන්ඩව ම සිටින්නේ නාගරික හෝ නිෂ්පාදන නිර්ධන පන්තියක් බවට පරිවර්තනය වීමේ අවස්ථාවේ ය. . . . සාපේක්ෂ අතිරික්ත ජනගහනයේ මෙම ප්‍රභවය එනයින් ගත් කල අඛන්ඩව වැඩෙයි. . . . එබැවින් කෘෂිකාර්මික ශ්‍රමිකයා අවම වැටුප් බවට ලඝු කෙරෙන අතර නිරතුරුව ම එක පයක් දැනටමත් තියා ගෙන සිටින්නේ දරිද්‍රතාව නමැති මඩ වගුරේ ය."

සමහර චීන අර්ථශාස්ත්‍රඥයන් ඉඩම්වල පූර්න පුද්ගලික අයිතිය ඉල්ලා ඇති අතර එය මේ වන තෙක් බෙයිජිං පාලනය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. එවන් පියවරක් සමාජ ආතතීන් තව දුරටත් තීව්‍ර කරනු ඇතුවා පමනක් නොව එය නැග එන ධනපති පන්තියේ අවශ්‍යතාවන් කපා ගෙන යා හැකි ය. මාක්ස් ද පැහැදිලි කල පරිදි, බදු කුලිය යනු කම්කරු පන්තියේ ශ්‍රමයෙන් උකහා ගනු ලබන අතිරික්ත වටිනාකම් තටාකයෙන් ඉඩම් හිමියන්ට ගෙවනු ලබන කොටසකි. කාර්මික ප්‍රාග්ධනයේ ආස්ථානයෙන් ගත් කල, රාජ්‍ය-සතු ඉඩම් පරපුටු ඉඩම්හිමියන් සමග ලාභය බෙදා ගැනීමේ අවශ්‍යතාව ඉවත් කරයි. ඓතිහාසිකව, චීන ජාතිකවාදී සුන් යත්-සෙන් වැනි ධනේශ්වර රැඩිකලුන් ඉඩම් ජනසතු කිරීමට කැඳවුම් කලේ ධනපති වර්ධනයට හැකි තරම් පුලුල්තම ඉඩකඩ විවෘත කරනු පිනිස ය. 1949 මාඕගේ ඉඩම් ප්‍රතිසංස්කරන සමාජවාදී පියවරක් නොව, පැරනි ඉඩම්හිමි පන්තිය අහෝසි කර දැමීම ඉලක්ක කර ගත් ධනේශ්වර පියවරක් විය.

ඉඩම්වල රාජ්‍ය අයිතිය, විදේශ ප්‍රාග්ධනය ආකර්ෂනය කරගනු වස් විශාල පරිමානයෙන් පොදු කාර්ය ව්‍යුහය හා කාර්මික කලාප ගොඩනැගීමේ නිදහස බෙයිජිං පාලනයට ලබා දුන්නේ යම් සේ ද එය එලෙස ම, නිෂ්පාදන කටයුතු සඳහා ඔවුන්ට අවශ්‍ය ඕනෑම ඉඩමක් පවරා ගැනීමේ හැකියාව කෘෂිකාර්මික සංගතවලට ලබා දෙනු ඇත. සිය ඉඩම් කැබලි අයිතිකර ගැනීමෙන් සුලු ගොවීන් වලකාලීම, සුලු පරිමාන කෘෂිකර්මාන්තය වෙත ආපසු යාමක් සිදු නොවනු ඇති බව සහතික කරයි. සිය ඉඩම බදු දෙන ගොවීන්ට එහි භාවිතය සම්බන්ධයෙන් තීන්දු ගැනීමේ එතරම් අයිතියක් නොලැබෙනු ඇති අතර අවසානයේ ඉඩම සම්බන්ධයෙන් තමන්ට පවත්නා සීමිත අයිතීන් පවා ඔවුන්ට අහිමි වනු ඇත.

අවසාන ප්‍රතිඵලය විය හැක්කේ පන්ති ආතතීන් තව දුරටත් තියුනු වීම පමනි. එක අතකින්, තියුනු ගෝලීය මන්දාවධමනයක් දැනටමත් වර්ධනය වන කොන්දේසි යටතේ, විශාල "අතිරික්ත" ගම්බද ශ්‍රම බලකායක් නගරවලට තල්ලු කෙරෙනු ඇත. අනෙක් අතට, දැනටමත් දහනශීලී ගම්බද ප්‍රදේශවල නව ග්‍රාමීය ධනේශ්වරය සහ කෘෂිකාර්මික නිර්ධන පන්තිය අතර පන්ති ප්‍රතිසතිතතා වර්ධනය වනු ඇත.


© www.wsws.org